අලි ප්‍රභේද

අලි ඇතුන් යනු ශ්‍රී ලාංකික සංස්කෘතිය හා බැඳුණු මහේශාක්‍ය සත්ත්ව කොට්ඨාශයකි. අප සංස්කෘතිය තුළ විවිධාකාරයෙන් අලි ඇතුන් වර්ග කළද, විද්‍යාත්මකව ශ්‍රී ලංකාව තුළ ඇත්තේ එක් උප විශේෂයක් පමණි. තෙත් කලාපයේ සහ වියළි කලාපයේ වෙසෙන අලි ඇතුන් තම වාසභූමි අනුව ඇතිකර ගත් වෙනස් දේහ ලක්ෂණ දැරුවද, මොවුන් විද්‍යාත්මකව වෙනස් වන්නේ නැත.

අලි පවුල

අලි ඇතුන් රංචු වශයෙන් ජීවත්වන අතර රංචුවේ නායකයා වයස්ගතම සහ විශාලතම ගැහැණු සත්ත්වයාවේ. පිරිමි සත්තු වයස අවුරුදු 12ක් 15ක් පමණ වන විට රංචුව හැර ගොස් තනිව හෝ තාවකාලිකව වෙනත් පිරිමි අලින් සමඟ ජීවත් වෙති. මේ නිසා කුඩා පිරිමි පැටවුන් හැරුණුකොට අලි රංචුවක සිටින්නේ ගැහැණු සතුන් පමණි. වඩා සමීප අලි පවුලක කුඩා පැටවුන් හැරුණුකොට වැඩිහිටි ගැහැණු සත්තු 5ත් 15ත් අතර ප්‍රමාණයක් සිටිති. පවුලක් වඩා විශාලවත්ම ගැහැණු සතුන් කිහිපයක් එක්වී වෙනම කුඩා රංචුවක් සාදා ගනී. එසේ වුවද, ඔවුන් තම පවුලේ සාමාජිකයන් සහ පිටස්තර රංචු වෙන් වෙන්ව හඳුනයි. පිරිමි සතුන් බොහෝවිට ආධිපත්‍යය දිනාගැනීම සඳහා සටන් කිරීමට කාලය යොදවයි. රංචුවේ ප්‍රමාණය සහ දේශගුණය අනුව අලි රංචුවක වාසස්ථාන සීමාව වර්ග කිලෝමීටර 10ත් 70ත් අතර පරාසයක පැතිරේ.



අලි මතකය

අලි ඇතුන් තම කණ්ඩායමේ සියලුම සාමාජිකයන් හඳුනන අතර ඒ සඳහා පෙනුම සහ සුවඳ යොදා ගනී. තම අත්දැකීම් හරහා මතක තබා ගැනීමට සමත් අලි ඇතුන් තමන් සමඟ එකට සිටි, හදා වඩා ගත්, උපකාරයක් හෝ හානියක් කළ වෙනත් සත්ත්ව විශේෂ පමණක් නොව අනතුරු හැඟවීම් කරන විශේෂ ඉඟි පවා මතක තබා ගනී. බොහෝ කාලයකට පසු වුවද තමන් ආ ගිය ස්ථාන අලි ඇතුන්ගේ මතකයේ පවතී. මතකය හා බැඳුණු ගැටළු විසඳීමේ හැකියාව තුලින් අලි ඇතුන් ඉතා බුද්ධිමත් සත්ත්ව කොට්ඨාශයක් බව හඳුනාගෙන ඇත. අනෙකාගේ හැඟීම් අවබෝධ කර ගැනීමට සහ බෙදා ගැනීමට ඇති හැකියාව, පරාර්ථකාමීත්වය සහ යුක්තිය පිළිබඳ අලි ඇතුන්ගේ සංවේදීතාවය ඔවුන් සුවිශේෂ සතුන් කොටසක් බවට පත් කරයි.

අලි කෑම

පැළෑටි සහ ශාක කොටස් ආහාරයට ගන්නා ඔවුන් ශාක භක්ෂකයින් වේ. වැඩුණු සත්ත්වයෙකුට දිනකට ආහාර කිලෝග්‍රෑම් 136 - 181ක් පමණ (රාත්තල් 300-400) අවශ්‍ය වේ. (සාමාන්‍ය මිනිසෙකු දිනකට ආහාරයට ගන්නේ කිලෝග්‍රෑම් 2.5 - 3ත් අතර ප්‍රමාණයකි). සාමාන්‍යයෙන් තෘණ වර්ග, කොළ, පළතුරු, අතු රිකිලි, කඳන්, ධාන්‍ය වර්ග මුල් සහ බීජ වර්ග ආහාර ලෙස ගන්නා මොවුන්, වී, කෙසෙල්, පොල්, මඤ්ඤොක්කා, බඩ ඉරිඟු, උක් වැනි බෝග ආහාරයට ගන්නේ ගොවියන්ටද වදයක් වෙමිනි. මොවුහුද කුඩා දරුවන් මෙන් ඇතැම් ආහාර ප්‍රිය නොකරති. වී අතරට; පැඟිරි කුලයේ ශාක (දෙහි, නාරං) තල, කොහොඹ ආදිය අයත් වේ.



අප්‍රිකානු අලි ඇතුන් හා ආසියානු අලි ඇතුන්

ශ්‍රී ලංකාවේ වෙසෙන අලි ඇතුන් විද්‍යාත්මකව හඳුන්වනු ලබන්නේ **Elephas maximus maximus** (එලිෆස් මැක්සිමස් මැක්සිමස්) යනුවෙනි. අප්‍රිකානු අලි ඇතුන්ට සාපේක්ෂව කුඩා දේහධාරී මොවුන් ඊට වඩා තද වර්ණයෙන් යුක්තය. දේහයේ කන්, මුහුණ, බඩ සහ හොඬවැල ආශ්‍රිතව වර්ණ පැල්ලම් ඇත. දුටු පමණින්ම මෙම අලි ඇතුන් දෙවර්ගය අපට වෙන්කර හඳුනාගත හැකි වුවත් මෙම වෙනසට හේතු ඉතා සිත්ගන්නා සුළුය.

අප්‍රිකානු අලි



ආසියානු අලි

කුම්බස්තලය

මැද ගිල්මක් ඇත.

නෙරිම් දෙකකි.

සම සහ කන් පෙති

කන සාපේක්ෂව විශාලය. සමේ රැලි අධිකය. අධික උෂ්ණ දේශගුණයක් ඇති පරිසරයේ ජීවත් වීමට මෙයින් හැකියාව ලැබී ඇත.

කන සාපේක්ෂව කුඩාය. සමේ රැලි වැටුණු ස්වභාවය අඩුය.

දළ යුගල

සෑම ගැහැණු සහ පිරිමි සතෙකුටම දළ යුගලක් ඇත.

රදනක දතෙන් හට ගන්නා දළ ඇත්තේ ඇතැම් පිරිමි සහ ඇතැම් ගැහැණු සතුන්ට පමණි.

හොඬවැල

හොඬවැල ඉතා ශක්තිමත් වන අතර අඟිස එක් තුඩක් ඇත.

හොඬවැල ඉතා ශක්තිමත් වන අතර අඟිස එක් තුඩක් ඇත.

කඳ

මතුපිට උඩු අතට වක් වූ/ උත්තල හැඩයක් ගනී.

මතුපිට පෘෂ්ඨය ඇතුළට ගිලුණු/අවතල හැඩයකින් යුක්තය.

අලි-මිනිස් ගැටුම



අලියා අපේ ගෙදර ඇවිත්ද?
අපි අලියගෙ ගෙදර ගිහින්ද?

"අලි-මිනිස් ගැටුම" යනු අද බොහෝ ගොවියන් මැදි වූ ආහාර, ජලය සහ වාසස්ථාන වෙනුවෙන් කරන යුද්ධයකි. අද වන විට මිනිසා සිය ජීවිකාව සඳහා වනාන්තර එළි පෙහෙළි කර වගා කටයුතු සිදුකරමින් සහ නිවාස සාදා ගනිමින් සිටිති. සාමාන්‍යයෙන් නිදහසේ සංචාරය කරන අලි ඇතුන් සිය සාමාන්‍ය සංචරණ සීමාව තුළ සැරිසරන විට ආහාරයට ගත හැකි දේ කා දැමීමෙන් සිය දෛනික ආහාර අවශ්‍යතාව සපුරා ගනී. දිනකට කිලෝග්‍රෑම් 2.5ත් 3ත් අතර ප්‍රමාණයක් ආහාරයට ගන්නා මිනිසා අක්කර 2ක් වගා කර සිය ආහාර අවශ්‍යතාවයෙන් ඉතා සුළු කොටසක් සපුරා ගනී නම්, දිනකට කිලෝග්‍රෑම් 130ක් 180ක් පමණ අවශ්‍ය අලි ඇතුන්ට ආහාර සොයා ගැනීමට අවශ්‍ය භූමි ප්‍රමාණය කොපමණක්ද?

ඔවුන්ගේ ශරීර ප්‍රමාණය සහ ශක්තිය අනුව, නිදහසේ සැරිසරන අලියෙකු අතින් වුවද වගා භූමි, නිවාස ආදියට සිදුවිය හැකි හානිය ඉතා විශාලය. තවද, අලි ඇතුන් නිතරම ගමන් ගන්නා මාර්ගය වන "අලිමංකඩ" අවහිර කළහොත්, එය රේල් පාර මත නිවසක් තැනුවා වැනිය. බොහෝ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන්, මිනිසා භයානක සත්ත්වයෙකු ලෙස අලි ඇතුන් හඳුනා ගන්නා අතර එබැවින්, අලි ඇතුන් මිනිසාට පහර දීම යනු නයා මිනිසාට දෂ්ඨ කරන්නාක් වැනි ආත්මාරක්ෂක ක්‍රියාවකි.

මේ නිසා අලි මිනිස් ගැටුමට විසඳුම ඇත්තේ විදුලි වැටට, අලි වෙඩිල්ලට වඩා ඔවුන්ගේ හැසිරීම සහ ආහාර අවශ්‍යතාවය තේරුම්ගත් මානුෂික ක්‍රියාමාර්ගයක් තුළය.

ඔබ දැන සිටියාද?

අලි ඇතුන් අතරත් අවමංගල්‍ය චාරිත්‍ර පවතින බව...

අලියෙකු මියගිය විට, සෙසු අලි ඇතුන් එම සත්ත්වයාගේ අවශේෂ හොඬවැලෙන් ස්පර්ෂ කරමින් නිහඬව සමාචාර දක්වයි. එම රංචුව තවදුරටත් ගමන් කරන්නේ නම් දළ, අස්ථි වැනි කොටස් ඔවුන් සමඟ රැගෙන යයි.

හක්කපටස්

ශ්‍රී ලංකාවේ අලි මරණ අතුරින් 50%කට හේතු සාධක වී ඇත්තේ හක්කපටස් බව හෙළිවී ඇත. හක්කපටස් යනු තුවක්කු කුඩු, ගල්, ඊයම් සහ යකඩ වලින් සාදන ලද කුඩා පුපුරණ ද්‍රව්‍යයකි. ප්‍රධාන වශයෙන් ග්‍රාමීය කෘෂිකාර්මික ගම්මාන වල ගොවීන් විසින් වන සතුන්ගෙන් තම වගාවන් ආරක්ෂා කිරීමට හක්කපටස් යොදාගනු ලබයි. මෙම පුපුරණ ද්‍රව්‍යට අලි ඇතුන් අද වන විට ගොදුරක් බවට පත්ව ඇත. අලි ඇතුන් සැරිසරන පෙදෙස්වලට උපක්‍රමශීලීව හක්කපටස් මිශ්‍ර කිරීමත්, ආහාරය සමඟ හක්කපටස් ගිල දැමීමත් හේතුවෙන් බොහෝ වනජීවීන් ඉතා අමානුෂික ලෙස ඝාතනයට ලක්වී ඇත. මුඛයට හානි වීම හේතුවෙන් මෙම සතුන්ට ආහාර ගැනීමට නොහැකිව දීර්ඝ කාලයක් වේදනා විඳීමෙන් අනතුරුව මරණයට පත් වේ.

2010 සිට 2019 දක්වා වන අලි මරණ සිදුවීමට හේතු

වෙඩි තැබීම	515	විෂ ශරීරගත වීමෙන්	81
හක්කපටස්	415	තුවාල සිදුවීමෙන්	163
විදුලි සැර වැදීම	242	හඳුනා නොගත්	591
අනතුරු	258		
ස්වභාවික මරණ	115		

2010 සිට 2019 දක්වා අලි මිනිස් මරණ සංඛ්‍යාත්මකව



	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019
Annual Elephant Deaths	227	255	250	206	229	205	279	256	319	407
Annual Human Death	82	60	73	70	67	63	88	87	96	122

KNCF

CEJ Centre For Environmental Justice

Friends of the Earth Sri Lanka

පරිසර යුක්ති කේන්ද්‍රය

20/ඒ, කුරුජ්පු පාර, කොළඹ 08, ශ්‍රී ලංකාව.

දුරකථනය/ෆැක්ස් 011 2683282, Email: info@ejustice.lk

උරුමයක් වූ අපේ අලි ඇතුන් ගැන දැන ගනිමු



www.ejustice.lk